මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022 අප්‍රේල් 01 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2022 ජනවාරි

## සමස්ත නිරීක්ෂණ

අඛණ්ඩව අටවැනි මාසයටත් එ.ජ ඩොලර් බිලියනය ඉක්ම වූ ඉහළ අපනයන ඉපැයීම් මධ්‍යයේ වුව ද, ආනයන වියදම අඛණ්ඩව ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් විය. සංචාරක පැමිණීම් පෙර වසරේ එම මාසයට වඩා, 2022 වසරේ ජනවාරි මාසයේ දී කැපී පෙනෙන ලෙස යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කළ අතර, 2022 වසරේ ජනවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල මන්දගාමී බවක් නිරීක්ෂණය විය. මේ අතර, ශ්‍රී ලංකාව 2022 ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 500ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සාර්ථකව පියවන ලදී. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මුල්‍ය සංවිධානය යටතේ ඉන්දියානු සංචිත බැංකුවෙන් එ.ජ. ඩොලර් මිලියන 400ක මුදල් හුවමාරු පහසුකම ලැබීමත් සමඟ, මාසය තුළ ගෙවුම් ශේෂයේ මූල්‍ය ගිණුම ශක්තිමත් විය. ජනවාරි මාසයේ එ.ජ ඩොලරයට රුපියල් 200-203 පරාසයේ පැවති අන්තර් බැංකු වෙළඳපොළේ බර තැබූ සාමාන්‍ය ඒකැන් විනිමය අනුපාතිකය, 2022 වසරේ මාර්තු මස 07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විනිමය අනුපාතිකයට වැඩි නම්‍යශීලී බවක් ලබා දීමත් සමඟ ඉහළ ගියේය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2020 එ.ජ.ඩො. මිලියන | 2021 එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | ජනවාරි 2021 එ.ජ.ඩො. මිලියන | ජනවාරි 2022 එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 10,047 | 12,499 | 24.4 | 937 | 1,101 | 17.5 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 16,055 | 20,637 | 28.5 | 1,592 | 1,959 | 23.1 |
| වෙළඳ ශේෂය | -6,008 | -8,139 | | -655 | -859 | |
| සංචාරක ඉපැයීම් | 682 | 507 (ආ) | -25.7 | 4 (ආ) | 148 (ඇ) | - |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 7,104 | 5,491 | -22.7 | 675 | 259 | -61.6 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -225 | -238 | | -44 | 36 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 2,002 | 2,435 | | 64 | 117 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 120 | 17 | | 3 | 5 | |
| දිගුකාලීන ණය | 1,882 | 2,418 | | 61 | 111 | |
| විදේශ සෘජු ආයෝජන (දළ) | 670 | 784 | | | | |
| සමස්ත ශේෂය | -2,328 | -3,967 | | | | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2022 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## වෙළඳ භාණ්ඩ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

**වෙළඳ ශේෂය:** ආනයන විශාල වශයෙන් ඉහළ යෑමත් සමඟ වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 655ට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 859ක් දක්වා පුළුල් විය. කෙසේ වෙතත්, 2022 වසරේ ජනවාරි මාසයේ වෙළඳ හිඟය, 2021 වසරේ දෙසැම්බර් මාසය තුළ වාර්තා වූ එ.ජ.ඩො. මිලියන 1,085ක හිඟයට සාපේක්ෂව අඩු විය. වෙළඳ ගිණුමේ හිඟය සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**වෙළඳ මිල අනුපාතය:** අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී සියයට 18.7කින් පහළ ගිය අතර, ආනයන මිල ගණන් ඉහළ යෑම සහ අපනයන මිල ගණන් පහළ යෑම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2022 වසරේ ජනවාරි මාසය තුළ දී වෙළඳ හිඟය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (අගය එ.ජ. ඩොලර් මිලියනවලින්)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2021-2022)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2021-2022)**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන: 2022 වසරේ ජනවාරි මාසයේ දී අපනයන ආදයම, 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,101ක් දක්වා සියයට 17.5කින් වර්ධනය වූ අතර, එය ජනවාරි මාසයක දී වාර්තා වූ ඉහළම අපනයන මට්ටමවේ.** සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ඉපැයීම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර, මෙම ඉහළ යෑම සඳහා කාර්මික අපනයන ප්‍රධාන වශයෙන් දායක විය.

**කාර්මික අපනයන:** ප්‍රධාන වශයෙන්, ඇඟලුම් සහ ඛනිජ තෙල් නිෂ්පාදිත ඇතුළු බොහෝ කාර්මික නිෂ්පාදන කාණ්ඩවල වාර්තා වූ සමස්ත වැඩිවීමත් සමඟ කාර්මික භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී සියයට 21.6කින් ඉහළ ගියේය. එක්සත් රාජධානිය හැර සියලුම ප්‍රධාන වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන වර්ධනය විය. නැව් සහ ගුවන්යානා සඳහා යොදාගනු ලබන ඉන්ධනවල මිල ගණන් සහ පරිමාවන් ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනවලින් ලද ඉපැයීම් ඉහළ ගියේය. තවද, පිඟන් මැටි නිෂ්පාදිත අපනයන ඉපැයීම් අඩු වුව ද, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ (ප්‍රධාන වශයෙන්, විදුලි සන්නායක සහ පරිණාමක) සහ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, මුදල් නෝට්ටු) අපනයනවල සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය.

**කෘෂිකාර්මික අපනයන:** කෘෂිකාර්මික භාණ්ඩ අපනයනයෙන් ලද සමස්ත ආදායම, 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී සියයට 2.3කින් ඉහළ ගිය අතර, ඒ සඳහා මූලික වශයෙන්, පොල් (ප්‍රධාන වශයෙන්, දිසිදි පොල්, පොල් කෙඳි, පොල්තෙල්), මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන්, නැවුම් සහ ශීත කළ කෙළවල්ලන්) සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, පුවක්) අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. ස්වභාවික රබර්, එළවළු සහ සකස් නොකළ දුම්කොළ අපනයනවල සුළු වර්ධනයන් වාර්තා විය. මේ අතර, 2022 වසරේ ජනවාරි මාසයේ දී, අපනයන පරිමාවන් සහ අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.7කින් පහළ ගිය අතර, කුරුඳු සහ කරාබුනැටි අපනයන පහළ යෑම හේතුවෙන් කුළුබඩු අපයනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 16.7කින් පහළ ගියේය.

**ඛනිජ අපනයන:** ප්‍රධාන වශයෙන්, ටයිටේනියම් ලෝපස්, ක්වාට්ස් සහ ස්වභාවික මිනිරන් කුඩු අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් ඛනිජ අපනයන ආදායම, 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී සියයට 24.0කින් ඉහළ ගියේය.

**අපනයන දර්ශක:** අපනයන ආදායම ඉහළ යෑම සඳහා අපනයන පරිමාවන් වැඩි වශයෙන් හේතු වූ බව නිරූපණය කරමින්, 2022 වසරේ ජනවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, අපනයන පරිමා දර්ශකය සියයට 20.1කින් ඉහළ ගිය අතර, ඒකක මිල දර්ශකය සියයට 2.2කින් පහළ ගියේය.

---

[1] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් අපනයන සංයුතිය ඇමුණුම Iහි දක්වා ඇත.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: මාසික අපනයන ඒකක මිල දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | ජන. -දෙසැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන. - දෙසැ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජනවාරි 2021 (එ.ජ.ඩො. මිලියන) | ජනවාරි 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **7,672.0** | **9,702.0** | **26.5** | **732.3** | **890.2** | **21.6** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 464.0 | 586.9 | 26.5 | 39.7 | 41.7 | 4.9 |
| සත්ත්ව ආහාර | 102.9 | 149.4 | 45.2 | 12.0 | 12.8 | 7.3 |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,423.1 | 5,435.1 | 22.9 | 423.0 | 516.1 | 22.0 |
| එයින්, ඇඟලුම් | 3,939.2 | 4,951.5 | 25.7 | 385.4 | 478.9 | 24.3 |
| රෙදිපිළි | 259.5 | 355.4 | 37.0 | 24.6 | 27.7 | 12.6 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 224.4 | 128.1 | -42.9 | 12.9 | 9.4 | -26.8 |
| රබර් නිෂ්පාදිත | 786.1 | 1,050.4 | 33.6 | 80.2 | 82.0 | 2.2 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 181.5 | 276.7 | 52.5 | 23.4 | 30.2 | 28.9 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 337.5 | 500.9 | 48.4 | 41.1 | 44.6 | 8.5 |
| ප්‍රවාහන උපකරණ | 71.4 | 148.2 | 107.5 | 6.8 | 8.9 | 30.9 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 373.6 | 506.4 | 35.6 | 34.4 | 67.2 | 95.2 |
| රසායනික නිෂ්පාදිත | 172.7 | 223.2 | 29.2 | 17.1 | 17.9 | 4.4 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 99.3 | 129.9 | 30.8 | 9.0 | 11.7 | 30.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 47.9 | 50.0 | 4.5 | 0.9 | 4.2 | 396.5 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 53.9 | 58.4 | 8.2 | 3.5 | 4.3 | 22.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 176.3 | 78.6 | -55.4 | 5.2 | 6.3 | 19.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 110.9 | 156.4 | 41.1 | 10.1 | 14.2 | 39.8 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 24.0 | 37.4 | 56.1 | 2.7 | 2.6 | -6.2 |
| වෙනත් කාර්මික අපනයන | 247.0 | 314.1 | 27.2 | 23.1 | 25.6 | 10.8 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **2,336.2** | **2,729.5** | **16.8** | **199.9** | **204.5** | **2.3** |
| තේ | 1,240.9 | 1,324.4 | 6.7 | 101.0 | 91.2 | -9.7 |
| රබර් | 30.1 | 42.2 | 40.1 | 3.9 | 5.1 | 29.4 |
| පොල් | 345.2 | 425.2 | 23.2 | 24.2 | 33.3 | 37.9 |
| කුළුබඩු | 333.5 | 454.8 | 36.4 | 42.0 | 35.0 | -16.7 |
| එළවළු | 36.6 | 28.5 | -22.0 | 1.7 | 2.2 | 35.3 |
| සකස් නොකළ දුම්කොළ | 25.5 | 31.6 | 23.9 | 2.2 | 2.3 | 3.9 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 134.7 | 148.8 | 10.5 | 8.1 | 11.2 | 39.0 |
| මුහුදු ආහාර | 189.8 | 274.1 | 44.4 | 16.9 | 24.1 | 42.6 |
| **3. ඛනිජ අපනයන** | **25.1** | **44.5** | **77.3** | **3.5** | **4.3** | **24.0** |
| **4. වර්ග නොකළ අපනයන** | **14.1** | **22.6** | **60.1** | **1.0** | **1.8** | **91.2** |
| **මුළු අපනයන** | **10,047.4** | **12,498.6** | **24.4** | **936.7** | **1,100.9** | **17.5** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: 2022 වසරේ ජනවාරි මාසයේ වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව පහළ ගිය ද, 2021 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,592 හා සැසඳීමේ දී, එ.ජ. ඩොලර් මිලියන 1,959ක් දක්වා සියයට 23.1කින් ඉහළ ගියේය.** සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම්වල කැපී පෙනෙන වැඩිවීම් දක්නට ලැබුණු අතර එම ඉහළ යෑම් සඳහා අන්තර් භාණ්ඩ ආනයන ප්‍රධාන වශයෙන් හේතු විය.

**පාරිභෝගික භාණ්ඩ:** 2022 වසරේ ජනවාරි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව සියයට 4.2කින් ඉහළ ගිය අතර, ආහාර සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙඅංශයෙහිම ඉහළ යෑම ඒ සඳහා හේතු විය. ආහාර හා පාන වර්ග ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 1.8කින් ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්) ආනයනය ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2021 වසරේ නොවැම්බර් මාසයේ සිට 2022 වසරේ ජනවාරි මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ දී සහල් ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 119 ඉක්මවීය. මේ අතර, සීනි, තෙල් සහ මේද වර්ග (ප්‍රධාන වශයෙන්, පොල්තෙල්), එළවළු (ප්‍රධාන වශයෙන්, මයිසූර් පරිප්පු), මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන්, වියළි හාල්මැස්සන්) සහ කුළුබඩු (ප්‍රධාන වශයෙන්, කොත්තමල්ලි ඇට) ආනයන වියදම්වල අඩුවීමක් දක්නට ලැබුණි. මේ අතර, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන සියයට 6.8කින් ඉහළ ගිය අතර, මේ සඳහා බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, එන්නත්), රෙදිපිළි හා උපාංග සහ රබර් නිෂ්පාදිත වියදම් ඉහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී, විදුලි සංදේශ උපකරණ (ප්‍රධාන වශයෙන්, ජංගම දුරකථන), ගෘහ උපකරණ (ප්‍රධාන වශයෙන්, රූපවාහිනී යන්ත්‍ර) සහ මුද්‍රිත ද්‍රව්‍ය ආනයනය පහළ ගියේය.

**අන්තර් භාණ්ඩ:** ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග (ප්‍රධාන වශයෙන්, රෙදි), මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ හා වානේ), තිරිඟු සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ප්‍රාථමික ආකාරයන්හි බහුඅවයවයක) හේතුවෙන්, 2022 වසරේ ජනවාරි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 32.5කින් ඉහළ ගියේය. බොරතෙල් ආනයන පරිමාවන් අඩු වුව ද, පිරිපහදු කළ ඛනිජ තෙල් (එල්.පී ගෑස් ඇතුළුව) සහ ගල් අඟුරු ආනයන මිල මෙන්ම පරිමාවන් ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ ජනවාරි මාසයේ දී ඉන්ධන ආනයන වියදම සියයට 38.9කින් ඉහළ ගියේය. බොරතෙල් බැරලයක් සඳහා සාමාන්‍ය ආනයන මිල, 2021 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් 57.65ට සහ 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් 85.38ට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් 84.09ක් විය. මේ අතර, 2022 වසරේ ජනවාරි මාසයේ දී, ආහාර සැකසුම් (මූලික වශයෙන් පාම් තෙල්), කෘෂිකාර්මික යෙදවුම් (ප්‍රධාන වශයෙන්, සත්ත්ව ආහාර), පොහොර, සහ රථවාහන හා යන්ත්‍රෝපකරණ කොටස් (ප්‍රධාන වශයෙන්, බයිසිකල් කොටස්) ආනයන වියදම පහළ ගියේය.

---

[2] සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය (සිව්වන සංස්කරණය) පදනම් කර ගත් ආනයන සංයුතිය ඇමුණුම IIහි දක්වා ඇත.

.

**ආයෝජන භාණ්ඩ:** 2022 වසරේ ජනවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව, සියයට 17.2කින් ඉහළ ගිය අතර මේ සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතු විය. 2021 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී, ඇලුමිනියම් ආශ්‍රිත නිෂ්පාදිත හැර, ගොඩනැගිලි ද්‍රව්‍ය යටතේ වන සියලුම උප අංශවල ආනයන වියදම් ඉහළ ගිය අතර යකඩ සහ වානේ ආනයන ඉහළ යෑම මේ අතරින් ප්‍රධාන විය. සම්ප්‍රේෂණ උපකරණ ආනයනවල පහළ යෑමක් වාර්තා වුව ද, ප්‍රධාන වශයෙන් ටර්බයින සහ විදුලි මෝටර සහ විදුලි ජනක යන්ත්‍ර කට්ටල ආනයන ඉහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ටැංකි හා බවුසර් ආනයනය අඩුවීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයනය වියදම අඩු විය.

**ආනයන දර්ශක:** 2022 වසරේ ජනවාරි මාසයේ දී, ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් මිල ගණන්වල බලපෑම හේතු වූ බව නිරූපණය කරමින්, 2022 වසරේ ජනවාරි මාසයේ දී (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක, පිළිවෙළින්, සියයට 2.3කින් සහ සියයට 20.3කින් ඉහළ ගියේය.

**රූප සටහන 7: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 8: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 9: මාසික ආනයන ඒකක මිල දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | ජන.- දෙසැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන.-දෙසැ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජනවාරි 2021 (එ.ජ.ඩො. මිලියන) | ජනවාරි 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **3,401.7** | **3,848.7** | **13.1** | **345.6** | **360.0** | **4.2** |
| ආහාර හා පාන වර්ග | 1,554.4 | 1,666.5 | 7.2 | 183.8 | 187.2 | 1.8 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 33.6 | 97.4 | 190.1 | 3.8 | 60.5 | 1,497.8 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 333.8 | 317.7 | -4.8 | 23.1 | 29.9 | 29.3 |
| එළවළු (ආ) | 352.9 | 384.3 | 8.9 | 40.5 | 29.6 | -26.8 |
| මුහුදු ආහාර | 188.6 | 122.3 | -35.2 | 12.1 | 8.5 | -30.2 |
| සීනි හා රසකැවිලි | 277.1 | 288.8 | 4.2 | 57.5 | 26.0 | -54.7 |
| කුළුබඩු | 126.9 | 127.2 | 0.3 | 12.6 | 11.9 | -5.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 241.6 | 328.8 | 36.1 | 34.3 | 20.8 | -39.4 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 1,847.3 | 2,182.2 | 18.1 | 161.8 | 172.8 | 6.8 |
| පෞද්ගලික රථවාහන | 282.9 | 12.8 | -95.5 | 0.5 | 0.7 | 31.9 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 595.5 | 882.5 | 48.2 | 44.8 | 78.9 | 76.0 |
| ගෘහ උපකරණ | 174.2 | 257.1 | 47.6 | 21.9 | 16.3 | -25.6 |
| රෙදිපිළි හා උපාංග | 200.7 | 221.3 | 10.3 | 18.5 | 22.9 | 23.5 |
| විදුලි සංදේශ උපකරණ | 268.4 | 382.9 | 42.6 | 38.4 | 16.7 | -56.4 |
| ගෘහ හා දැව භාණ්ඩ | 146.9 | 161.2 | 9.8 | 15.6 | 15.3 | -1.9 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 178.7 | 264.4 | 47.9 | 22.0 | 22.0 | 0.1 |
| **2. අන්තර් භාණ්ඩ** | **9,076.5** | **12,308.9** | **35.6** | **915.0** | **1,212.5** | **32.5** |
| ඉන්ධන | 2,542.6 | 3,742.9 | 47.2 | 309.8 | 430.3 | 38.9 |
| එයින්, බොරතෙල් | 583.0 | 625.1 | 7.2 | 82.2 | 58.5 | -28.8 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 1,742.2 | 2,840.0 | 63.0 | 196.5 | 311.2 | 58.4 |
| ගල්අඟුරු | 217.3 | 277.8 | 27.8 | 31.1 | 60.6 | 94.6 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 117.2 | 143.6 | 22.5 | 11.0 | 14.0 | 26.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,335.1 | 3,066.9 | 31.3 | 236.5 | 316.5 | 33.9 |
| කඩදාසි හා ඝන කඩදාසි | 383.1 | 468.9 | 22.4 | 31.3 | 41.3 | 32.2 |
| කෘෂිකාර්මික යෙදවුම් | 200.8 | 264.2 | 31.6 | 23.2 | 17.0 | -26.7 |
| තිරිඟු හා ඉරිඟු | 384.4 | 418.3 | 8.8 | 6.9 | 41.7 | 507.6 |
| මූල ලෝහ | 460.3 | 866.4 | 88.2 | 38.7 | 74.8 | 93.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 540.2 | 765.7 | 41.8 | 59.3 | 77.1 | 29.9 |
| රසායනික නිෂ්පාදිත | 831.5 | 1,074.4 | 29.2 | 88.1 | 86.9 | -1.4 |
| පොහොර | 258.9 | 158.2 | -38.9 | 4.7 | 2.5 | -47.3 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 218.7 | 400.7 | 83.2 | 26.1 | 33.8 | 29.6 |
| ඛනිජ නිෂ්පාදිත | 168.9 | 158.9 | -5.9 | 12.3 | 16.5 | 34.9 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 634.9 | 779.7 | 22.8 | 67.1 | 60.0 | -10.6 |
| **3. ආයෝජන භාණ්ඩ** | **3,563.2** | **4,462.7** | **25.2** | **330.1** | **386.7** | **17.2** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,176.1 | 2,809.5 | 29.1 | 216.6 | 243.8 | 12.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,035.6 | 1,248.9 | 20.6 | 87.7 | 124.0 | 41.4 |
| ප්‍රවාහන උපකරණ | 348.3 | 398.5 | 14.4 | 25.5 | 18.7 | -26.8 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 3.2 | 5.8 | 81.4 | 0.2 | 0.2 | 32.4 |
| **4. වර්ග නොකළ ආනයන** | **14.0** | **17.1** | **22.2** | **1.0** | **0.1** | **-87.7** |
| **මුළු ආනයන** | **16,055.4** | **20,637.4** | **28.5** | **1,591.6** | **1,959.4** | **23.1** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **13,512.8** | **16,894.6** | **25.0** | **1,281.7** | **1,529.1** | **19.3** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 325ක් සහ පෙර වසරේ ජනවාරි මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 675ට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 259ක් ලෙස වාර්තා විය. ප්‍රධාන වශයෙන් පුහුණු (6,248), නුපුහුණු (6,013) සහ ගෘහ සේවිකා (5,999) යන කාණ්ඩ වල දායකත්වයෙන්, 2022 වසරේ ජනවාරි මාසය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය 21,164ක් ලෙස වාර්තා විය.

**සංචාරක පැමිණීම්:** 2021 වසරේ දෙසැම්බර් මාසයේ වාර්තා වූ 89,506ක සංචාරක පැමිණීම් ප්‍රමාණයට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසයේ දී පැමිණි සංචාරකයන් ප්‍රමාණය 82,327ක් ලෙස වාර්තා විය. 2022 වසරේ ජනවාරි මාසය තුළ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි රටවල් ලෙස රුසියාව, ඉන්දියාව, යුක්රේනය, එක්සත් රාජධානිය සහ ජර්මනිය පැවතුණි. 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 233ක් සහ පෙර වසරේ ජනවාරි මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 4ට සාපේක්ෂව 2022 වසරේ ජනවාරි මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 148ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 10: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 11: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලය ලැබීම්

2022 වසරේ ජනවාරි මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් සුළු ප්‍රමාණයක් වාර්තා විය. 2022 වසරේ ජනවාරි මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 4ක සමස්ත ශුද්ධ ලැබීමක් වාර්තා වූ අතර, නොපියවා ඉතිරිව ඇති විදේශීය ආයෝජන ප්‍රමාණය 2022 වසරේ ජනවාරි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 13ක් ලෙස අඩු මට්ටමක පැවතුණි. මේ අතර, 2022 වසරේ ජනවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 36ක ශුද්ධ ලැබීමක් සිදු විය.

## ජාත්‍යන්තර සංචිත

රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එ.ජ. ඩොලර් මිලියන 500ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර පියවීම සහ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය යටතේ ඉන්දියානු සංචිත බැංකුවෙන් එ.ජ. ඩොලර් මිලියන 400ක මුදල් හුවමාරු පහසුකම ලැබීමත් සමඟ 2022 වසරේ ජනවාරි මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 2.4ක් විය. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2022 වසරේ ජනවාරි මාසය අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 5.4ක් විය.

**රූප සටහන 12: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**මහ බැංකුව විසින් විනිමය අනුපාතිකයට ඉහළ නම්‍යශීලීභාවයක් ලබා දීම හේතුවෙන් විනිමය අනුපාතිකයේ කැපී පෙනෙන ඉහළ යාමක් 2022 මාර්තු මාසයේ සිට නිරීක්ෂණය විය.** 2022 වසරේ මුල් මාස දෙක තුළ ශ්‍රී ලංකා රුපියල පුළුල් ලෙස ස්ථාවරව තබා ගත් නමුත්, 2022 වසරේ මාර්තු මස පළමු සතියේ දී විනිමය අනුපාතිකයට ඉහළ නම්‍යශීලීභාවයක් ලබා දීමට මහ බැංකුව ගත් තීරණයේ ප්‍රතිඵලයක් ලෙස, එය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් 01 දක්වා වූ කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 33.0ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 වසරේ අප්‍රේල් 01වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යුරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඉන්දියානු රුපියල සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය.

**රූප සටහන 13: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම**

| මුදල් ඒකකය | 2020 | 2021 | 2022 (අප්‍රේල් 01 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.6% | -7.0% | -33.0% |
| යුරෝ | -11.2% | +1.1% | -31.5% |
| ස්ටර්ලින් පවුම | -6.2% | -6.0% | -31.1% |
| ජපන් යෙන් | -7.5% | +3.8% | -28.7% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -11.4% | -1.2% | -35.1% |
| ඉන්දියානු රුපියල | 0.0% | -5.5% | -31.6% |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම I:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)

| කාණ්ඩය | ජන. - දෙසැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන. - දෙසැ. 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජනවාරි 2020 (එ.ජ.ඩො. මිලියන) | ජනවාරි 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **2,409.3** | **2,846.0** | **18.1** | **209.2** | **215.8** | **3.1** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 214.8 | 316.0 | 47.1 | 19.2 | 27.2 | 41.2 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 63.9 | 71.8 | 12.4 | 5.7 | 5.8 | 1.3 |
| 05 එළවළු හා පලතුරු | 394.4 | 468.2 | 18.7 | 27.6 | 39.1 | 41.6 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 1,542.7 | 1,742.9 | 13.0 | 140.4 | 125.8 | -10.4 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **116.6** | **145.2** | **24.6** | **10.5** | **8.7** | **-16.8** |
| 11 පාන වර්ග | 31.4 | 33.3 | 6.1 | 2.7 | 2.4 | -12.0 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 85.2 | 112.0 | 31.4 | 7.7 | 6.3 | -18.5 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **368.6** | **433.2** | **17.5** | **31.0** | **38.0** | **22.6** |
| 23 සකස් නොකළ රබර් | 31.1 | 43.1 | 38.6 | 4.0 | 5.2 | 29.3 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 232.9 | 240.3 | 3.2 | 16.8 | 18.7 | 11.7 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **373.6** | **506.4** | **35.6** | **34.4** | **67.2** | **95.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 354.4 | 462.9 | 30.6 | 34.4 | 51.3 | 49.1 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 19.1 | 43.5 | 127.5 | - | 15.9 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **96.6** | **128.9** | **33.4** | **7.1** | **6.8** | **-3.7** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 79.1 | 86.1 | 8.8 | 4.3 | 5.6 | 31.3 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **224.0** | **291.7** | **30.2** | **21.6** | **20.8** | **-3.7** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **1,344.0** | **1,700.7** | **26.5** | **131.7** | **144.3** | **9.6** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 537.0 | 684.5 | 27.5 | 52.7 | 53.8 | 2.0 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 424.8 | 458.4 | 7.9 | 35.1 | 36.2 | 3.1 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 217.9 | 335.1 | 53.8 | 28.7 | 34.6 | 20.5 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **396.1** | **631.8** | **59.5** | **46.9** | **52.2** | **11.4** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 239.1 | 318.4 | 33.1 | 22.4 | 27.4 | 22.3 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **4,718.6** | **5,813.1** | **23.2** | **444.1** | **547.1** | **23.2** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 4,342.1 | 5,360.0 | 23.4 | 415.6 | 510.7 | 22.9 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.1** | **1.5** | **1,205.2** | **0.2** | **...** | **-** |
| **මුළු අපනයන** | **10,047.4** | **12,498.6** | **24.4** | **936.7** | **1,100.9** | **17.5** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම II:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | ජන. - දෙසැ. 2020 (එ.ජ.ඩො. මිලියන) | ජන. - දෙසැ 2021 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජනවාරි 2021 (එ.ජ.ඩො. මිලියන) | ජනවාරි 2022 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **2,107.6** | **2,275.2** | **8.0** | **201.4** | **248.7** | **23.5** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 334.2 | 318.1 | -4.8 | 23.2 | 30.0 | 29.1 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 189.6 | 123.6 | -34.8 | 12.2 | 8.6 | -29.6 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 415.3 | 513.0 | 23.5 | 10.3 | 102.0 | 888.7 |
| 05 එළවළු හා පලතුරු | 418.9 | 457.7 | 9.3 | 46.6 | 36.3 | -22.0 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 277.2 | 288.9 | 4.2 | 57.5 | 26.0 | -54.7 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 161.1 | 169.5 | 5.2 | 16.0 | 16.5 | 2.9 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **93.8** | **76.8** | **-18.1** | **7.0** | **7.8** | **10.6** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **436.2** | **584.7** | **34.0** | **40.3** | **49.0** | **21.7** |
| 23 සකස් නොකළ රබර් | 182.0 | 351.0 | 92.9 | 22.2 | 28.2 | 27.3 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 75.2 | 25.0 | -66.8 | 1.9 | 1.8 | -7.0 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **2,542.6** | **3,742.9** | **47.2** | **309.8** | **430.3** | **38.9** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 2,048.6 | 3,118.4 | 52.2 | 261.1 | 337.4 | 29.2 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 276.6 | 346.6 | 25.3 | 17.6 | 32.3 | 83.5 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **195.4** | **285.2** | **45.9** | **33.4** | **7.8** | **-76.5** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 186.6 | 262.3 | 40.6 | 31.6 | 5.7 | -81.8 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **2,192.4** | **2,847.9** | **29.9** | **195.4** | **246.8** | **26.3** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 549.4 | 823.1 | 49.8 | 38.7 | 75.4 | 94.9 |
| 56 පොහොර | 258.7 | 157.6 | -39.1 | 4.7 | 2.5 | -47.3 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 367.9 | 561.2 | 52.5 | 41.7 | 57.5 | 38.0 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 144.2 | 173.3 | 20.2 | 15.6 | 18.7 | 19.8 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **4,474.3** | **5,976.8** | **33.6** | **421.1** | **587.5** | **39.5** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 367.7 | 442.0 | 20.2 | 30.5 | 37.5 | 23.0 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 2,258.3 | 3,007.8 | 33.2 | 233.8 | 308.5 | 31.9 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 520.1 | 525.2 | 1.0 | 40.8 | 55.0 | 35.0 |
| 67 යකඩ හා වානේ | 625.2 | 1,071.4 | 71.4 | 43.8 | 96.3 | 119.8 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **3,204.4** | **3,876.2** | **21.0** | **307.0** | **294.5** | **-4.1** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 434.1 | 652.0 | 50.2 | 53.0 | 56.6 | 6.8 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 515.2 | 599.2 | 16.3 | 51.4 | 46.1 | -10.4 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 219.4 | 354.6 | 61.6 | 26.0 | 29.0 | 11.8 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 526.9 | 785.3 | 49.1 | 68.1 | 38.6 | -43.4 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 564.4 | 750.2 | 32.9 | 62.2 | 62.2 | 0.04 |
| 78 රථවාහන | 561.0 | 327.8 | -41.6 | 30.7 | 20.9 | -31.9 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **790.2** | **953.3** | **20.6** | **75.0** | **86.5** | **15.3** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 172.4 | 190.0 | 10.2 | 14.6 | 19.4 | 33.5 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 186.5 | 237.7 | 27.4 | 17.4 | 15.7 | -9.6 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **18.5** | **18.4** | **-0.4** | **1.2** | **0.4** | **-68.8** |
| **මුළු ආනයන** | **16,055.3** | **20,637.4** | **28.5** | **1,591.6** | **1,959.4** | **23.1** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf